ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2141/80 - 2019 සැප්තැම්බර් මස 20 වැනි සිකුරාදා - 2019.09.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පස්බාගේ කෝරලේ සුළු කොට්ඨාසයේ කොට්ඨාස අංක 1084 ඉඹුල්පිටිය ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ මැදගහවතුර ගමේ පිහිටි මහනුවර දිස්ත්‍රික්කයේ මිනින්දෝරු අධිකාරී විසින් 2019.03.29 වැනි දින සකස් කර ඇති මු.පි. මහ 6920හි;

01. **කැබලි අංක 01; ඉඹුල්පිටියවත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 1.5344;**

උතුරට: වතුපාර සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ඉඹුල්පිටිය වත්ත;නැගෙනහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ඉඹුල්පිටිය වත්ත සහ වතුපාර; දකුණට සහ බටහිරට: වතුපාර.

01. **කැබලි අංක 02; ඉඹුල්පිටියවත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.4891;**

උතුරට: වතුපාර ;නැගෙනහිරට: වතුපාර සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ඉඹුල්පිටිය වත්ත; දකුණට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ඉඹුල්පිටිය වත්ත සහ වතුපාර; බටහිරට: වතුපාර.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් 2019 ඔක්තෝබර් මස 30 වැනි දින පෙ.ව. 10.00 ට නාවලපිටිය පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019 ඔක්තෝබර් මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

සී.කේ. අමරකෝන්
ප්‍රාදේශීය ලේකම්,
පස්බාගේ කෝරලේ නාවලපිටිය.

2019 සැප්තැම්බර් මස 09 වැනි දින,
නාවලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-182

1A - G31030 - 22(2019/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තරය:*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිගම්පල් කෝරළේ සුළු කොට්ඨාසයේ අංක 135 ඒ වැලිහෙලතැන්න ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ වැලිහෙලතැන්න පරුස්සැල්ල ගම පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක මූ.පි.කැ 3341 හා 2009.10.24 දරන මූලික පිඹුරේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 6.8044ක් වන පහත සඳහන් 01 සිට 06 ලෙස දක්වා ඇති ඉඩම් කොටස් වලට මායිම් වලින් යුත් ඉඩම;

01. **කැබලි අංක 01; පොලටගම වත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 1.0635;**

උතුරට: වතුපාර සහ පොලටගම වත්ත;නැගෙනහිරට: පොලටගම වත්ත; දකුණට: ඇල; බටහිරට: ඇල සහ වතුපාර.

02. **කැබලි අංක 02; පොලටගම වත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.4778;**

උතුරට: ඇල;නැගෙනහිරට: ඇල සහ පොලටගම වත්ත; දකුණට: පොලටගම වත්ත සහ වතුපාර; බටහිරට: වතුපාර.

03. **කැබලි අංක 03; පොලටගම වත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0158;**

උතුරට සහ නැගෙනහිරට: වතුපාර; දකුණට සහ බටහිරට: පොලටගම වත්ත.

04. **කැබලි අංක 04; පොලටගම වත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1613;**

උතුරට සහ නැගෙනහිරට: වතුපාර; දකුණට: පොලටගම වත්ත සහ වතුපාර; බටහිරට: වතුපාර.

05. **කැබලි අංක 05; පොලටගම වත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 3.7535;**

උතුරට: වතුපාර සහ පොලටගම වත්ත;නැගෙනහිරට: පොලටගම වත්ත සහ ඇල; දකුණට: වැලිහෙල් ඔය; බටහිරට: ඇල සහ වතුපාර.

06. **කැබලි අංක 06; පොලටගම වත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 1.3355;**

උතුරට: වතුපාර;නැගෙනහිරට: ඇල; දකුණට: වැලිහෙල් ඔය; බටහිරට: පොලටගම වත්ත වතුපාර.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2019 ඔක්තෝබර් මස 23 වැනි දින පෙ.ව. 10.00 ට යටියන්තොට මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019 ඔක්තෝබර් මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තර වන්දි විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

ආර්. කේ. සමන් අනුර,
ප්‍රාදේශීය ලේකම්,
යටියන්තොට.

2019 සැප්තැම්බර් මස 17 වැනි දින,
යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-184

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.